C
372
BIS

# අ.පො.ස.(උසස් පෙළ) සිසුන්ගේ අනාගත අභිලාෂ හා සමාජ ආර්ථික පසුබිම

# THE FUTURE ASPIRATIONS AND SOCIO-ECONOMIC BACKGROUND OF G.C.E. A-LEVEL STUDENTS (A STUDY BASED ON A SAMPLE DRAWN FROM KURUNEGALA DISTRICT)

**එච්.ඇම්.බිසෝමැණිකේ**
වාණිජවේදී උපාධි (ගෞරව) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා(සම්මාන)
අධ්‍යාපන දර්ශනපති උපාධි නිබන්ධනය,
අධ්‍යාපන විද්‍යා අංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය,
ශ්‍රී ලංකාව.

514793

පර්යේෂණ උපදේශක:
ආචාර්යය පී.එච්.ජී.එන්.එස්.ජයසේන මහත්මිය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය,
ශ්‍රී ලංකාව.

# සාරාංශය

අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ අනාගත අභිලාෂ හා සමාජ ආර්ථික පසුබිම අතර පවත්නා සබඳතාව විමසා බැලීම මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණු විය.

පර්යේෂණ නියැදිය විවිධ පාසල් වර්ගවල අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ (අ.පො.ස. උසස් පෙළ) විද්‍යා, කලා, වාණිජ යන විෂය ධාරාවන්හි ඉගෙනුම ලබන පිරිමි හා ගැහැණු සිසුන් තුන්සිය හැටදෙනෙකුගෙන් (n=360) සමන්විත විය. විවිධ සමාජ මට්ටම හා ග්‍රාමීය නාගරික වෙනස නියෝජනය වන අයුරින් නියැදිය තේරීමේදී සැලකිල්ල දක්වන ලදී. ප්‍රශ්නාවලි භාවිතය, අව්ධිමත් සම්මුඛ සාකච්ඡා, ලේඛණගත දත්ත යන පර්යේෂණ උපකරණ භාවිතා කිරීමෙන් හා නියාමක පරීක්ෂණයකින් අනතුරුව ලබාගන්නා ලද දත්ත තරා කිරීමෙන්, ප්‍රතිශතක භාවිතා කිරීමෙන් හා කයිවර්ග පරීක්ෂාවට ලක්කිරීමෙන් ලැබූ පර්යේෂණ ප්‍රතිඵල විවිධ අනු මාතෘකා යටතේ සංවිධානය කරනලදී. එම අනුමාතෘකා පහත විස්තරවේ.

1. <u>හඳුනා ගත් අභිලාෂ</u>

සිසුන් විසින් වැදගත්කමේ අනුපිළිවෙළ අනුව නම්කරන ලද අභිලාෂයන් පහළොවක් (15) දත්ත ආශ්‍රයෙන් හඳුනාගත හැකිවිය. එසේ හඳුනා ගන්නා ලද අභිලාෂයන් තරා කිරීමේදී එක් එක් අභිලාෂයන්ට හිමිවූ තරාවන් අනුව නාගරික හා ගම්බද සිසුන් දෙවර්ගයටම පොදුවූ අභිලාෂ තුනක් විය. රජයේ උසස් රැකියාවක් කිරීම, දෙමාපියන් රැකබලාගැනීම හා ඔවුන්ට සැලකීම හා විශ්ව විද්‍යාලයට පිවිසීම යන්න එසේ තෝරනු ලැබූ පොදු අභිලාෂ තුන විය.

පොදු තරාව හිමි නොවූ සෙසු අභිලාප දොළහ (12) වූයේ අ.පො.ස (උසස් පෙළ) විභාගය සමත්වීම, සාර්ථක විවාහ ජීවිතයක් ගතකිරීම, යහපත් ජීවිතයක් ගතකිරීම, රටට දැයට සේවයක් කිරීම, සහෝදර සහෝදරයන්ට ඉගෙන ගැනීමට සහයෝගය දැක්වීම, යහපත් ආර්ථිකයක් ගොඩනගා ගැනීම, වෘත්තිය පාඨමාලාවක් හැදෑරීම, හොඳ නිවසක් සාදා ගැනීම, විදේශගතව උසස් අධ්‍යාපනය හැදෑරීම, දරුවන්ට උසස් අධ්‍යාපනයක් හා සමාජ මට්ටමක් ලබාදීම, අසරණයින්ට හැකි අයුරින් පිහිටවීම යන අභිලාපයන්ය. මෙම එක් එක් අභිලාපයන්හි සමාජ, ආර්ථික හා සංස්කෘතික වටිනාකම

වෙන වෙනම විමසා බැලීමේදී රජයේ උසස් රැකියාවක් කිරීම, දෙමාපියන් රැකබලා ගැනීම හා සැලකීම, විශ්ව විද්‍යාලයට පිවිසීම වඩා ප්‍රබල අභිලාෂ බව තහවුරු විය.

2. <u>අනාගත අභිලාෂ හා සමාජ ආර්ථික පසුබිම අතර සබැඳියාව</u>

මෙහිදී අ.පො.ස. (උසස් පෙළ) නාගරික හා ග්‍රාමීය සිසුන් ඇසුරින් හඳුනා ගන්නා ලද අනාගත අභිලාෂයන් පහළොව (15), පර්යේෂිකාව විසින් අධ්‍යාපනික අභිලාෂයන්, ආර්ථිකමය අභිලාෂයන් හා පවුල් සබඳතා වර්ධනය කර ගැනීම සඳහාවූ අභිලාෂයන් වශයෙන් වෙන් කොට වර්ගීකරණය කරන ලදී. ඒවපසු එම අභිලාෂ වර්ග තුන හා සමාජ පන්තිය අතර පවතින සබඳතාවද විමසා බලන ලදී. මෙමඟින් අනාවරණය වූයේ සිසුන්ගේ අධ්‍යාපනික, ආර්ථිකමය හා පවුල් හා සමාජ සබඳතා වර්ධනය කර ගැනීම යන අභිලාෂයන් හා සමාජ පන්තිය අතර සබඳතාවයන් පවතින බවකි. එහිදී විශේෂයෙන්ම තහවුරු වූයේ ආර්ථිකමය අභිලාෂයන් හා සමාජ පන්තිය අතර ඇති දැඩි සම්බන්ධතාවයයි.

අනතුරුව සිසුන් විසින් දක්වන ලද ප්‍රතිචාර අනුව පර්යේෂිකාව විසින් හඳුනා ගන්නා ලද ප්‍රධාන අභිලාෂයන් වර්ග දෙකක් විය. මෙයින් එක වර්ගයක් සුවිශේෂ අභිලාෂ වශයෙනුත්, අනෙක රැකියා අභිලාෂ වශයෙනුත් හඳුන්වන ලදී. ඉන්පසු මෙම අභිලාෂ වර්ග දෙක හා බැඳුනු අනු මාතෘකා යටතේ දත්ත විශ්ලේෂණය කිරීම සිදු කර ඇත. එම වර්ග දෙක පිළිබඳව පහත විස්තර වේ.

i. <u>සුවිශේෂ අභිලාෂයන් විවිධ විචල්‍ය සමඟ පවත්නා සබඳතාවය</u>

මෙහිදී පාසල් වර්ගය අනුවත්, නගරබඳ හා ගම්බඳ ශිෂ්‍ය නියැදීන් වෙන වෙනමත් හා එක්කොට ගෙනත්, ස්ත්‍රී පුරුෂ භාවය අනුවත්, සුවිශේෂ අභිලාෂයන් හා සමඟ පවත්නා සබඳතාවය විමර්ශනයට භාජනය කර ඇත. එහිදී පාසල් වර්ගය, නාගරික ග්‍රාමීය වෙනස, ස්ත්‍රී පුරුෂ භාවය අනුව අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ සුවිශේෂ අභිලාෂයන්හි වෙනස්කම් ඇති බව හඳුනා ගැනීමට හැකිවිය.

ii. රැකියා අභිලාෂ විවිධ විචල්‍යයන් අතර පවත්නා සම්බන්ධතාවය

මීළඟට විමර්ශනයට භාජනය කරනු ලැබුයේ ප්‍රධාන අභිලාෂ වර්ග දෙකෙන්, දෙවන වර්ගය වන රැකියා අභිලාෂයන් සම්බන්ධවයි. එම අභිලාෂය විචල විචල්‍යයන් වන සමාජ පන්තිය, පාසල් වර්ගය, පියාගේ රැකියාව, පියාගේ හා මවගේ අධ්‍යාපන මට්ටම හා විෂය ධාරාවන් යන ක්ෂේත්‍ර ඔස්සේ නාගරික, ග්‍රාමීය වෙනසද නියෝජනය වන ආකාරයට විමර්ශනයට භාජනය කරන ලදී. එමඟින්ද ඉහත දක්වන ලද විවිධ විචල්‍යයන් අනුව අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ රැකියා අභිලාෂයන්හි වෙනස්කම් දැකිය හැකි බව තහවුරු විය.

3. නිගමන හා යෝජනා

තවද මෙම පර්යේෂණ ප්‍රතිඵල ආශ්‍රයෙන් බැසගත හැකිවූ නිගමන හා යෝජනා පහත දැක්වෙන පරිදි සාරාංශ කර දැක්විය හැකිය. ඒ අනුව අ. පො. ස. (උසස් පෙළ) සිසුන් විවිධ වූ අනාගත අභිලාෂයන්ගෙන් යුක්ත බවත්, අනාගත අභිලාෂ හා සමාජ ආර්ථික පසුබිම අතර සබැඳියාවක් පැවති බවත්, ප්‍රධානතම අභිලාෂය විවිධ විචල්‍ය සමඟ පවත්නා සබඳතාවයෙහි වෙනස්කම් දැකිය හැකි බවත්, ශිෂ්‍ය රැකියා අභිලාෂ විවිධ විචල්‍යයන් සමඟ දක්වන සම්බන්ධතාවයෙහි වෙනස්කම් දැකිය හැකි බවත් නිගමනය කළ හැකිවිය.

මෙම පර්යේෂණ නිගමනයන් අනුව පර්යේෂිකාව විසින් සුදුසු යැයි ඉදිරිපත් කරන ලද යෝජනාවන්ද ප්‍රධාන මාතෘකා කිහිපයක් යටතේ ගොනුකර ඇත. ඒවා නම් උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, විෂයමාලාව තුළ ඇති කළ යුතු වෙනස්කම්, විෂයමාලාව ප්‍රායෝගිකරණය, ආකල්පමය වෙනස්කම් ඇති කිරීම, ඇගයීම් ක්‍රමය වෙනස් කිරීම, තාක්ෂණය සම්බන්ධකර ගැනීම, රජයේ වගකීම්, පාසල් තුළ ඇති අසමතුලිතතාවයන් මර්දනය කිරීම, පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම, ආදී යෝජනා පිළිබඳව සාකච්ඡා කොට ඇත. මෙම සියළු කරුණු පිළිබඳව අවධානය යොමුකරමින් සුදුසු පූර්වාදර්ශ සිසුනට ලබාදීමටත්, ඔවුන්ගේ අභිලාෂයන් ඉටුවන ආකාරයේ අධ්‍යාපනික, ආර්ථික හා සමාජයීය සැළසුම් සකස්විය යුතුවා මෙන්ම ඒ සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කිරීමටද මුළු මහත් ප්‍රජාවගේම අවධානය යොමු විය යුතුව ඇත.